# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,185 — 1960 අගෝස්තු 19 වැනි සිකුරාද — 19.8.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 631 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 645 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 634 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 634 | රට තීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් සත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 645 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීනු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධූනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධූනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධූනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධූනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීනුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නව ප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබූවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදුවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ සථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පස් සංරක්ෂණ සහායක තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පස් සංරක්ෂණ සහායක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**2. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) වර්ෂ 1960ක් වූ සැප්තැම්බර් මස 5 වැනි දිනට වයස අවුරුදු 19ට නොඅඩු හා 25ට නොවැඩි බවට ;

(ආ) පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලීය සහතිකය ලබා ඇති බවට හෝ උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හා සෙසු විද්‍යා විෂයයකුත් ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් බවට ;

(ඇ) හොඳ ශරීර සෞඛ්‍යයක් හා මනා චරිතයක් ඇති බවට.

**3. පුහුණුව.**—තෝරාගනු ලබන අපේක්ෂකයන්ට මූලික කෘෂිකර්මය, උද්භිද විද්‍යාව හා ප්‍රධාන වන ශාක වර්ග ඇතුළත් මූලික වන විද්‍යාව, වැවිලි බෝග, මූලික පස් සංරක්ෂණ හා ජල සංරක්ෂණ ක්‍රම, සිතියම් පාඨනය පිළිබඳ මූලික කරුණු, ග්‍රාමීය හා වතු යායවල ඉඩම් භාවිත සමීක්ෂණ යන විෂයයන් පිළිබඳ හය මාසයක පමණ පුහුණුවක් දෙනු ලැබේ.

**4. වැටුප් හා වෙනත් දීමනා.**—තෝරාගත් අපේක්ෂකයන් හට පුහුණුවන කාලය තුළදී රුපියල් 60ක මූලික වේතනයක් සමග සෙසු දීමනාවන් ද ගෙවන අතර සතුටුදායක ලෙස පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුද්දකට රුපියල් 960—72—රුපියල් 2,688 යන වැටුප් ක්‍රමය මත පස් සංරක්ෂණ සහායකවරුන් වශයෙන් පත් කරනු ලැබේ.

**5. පත්වීම් පිළිබඳ කොන්දේසි.**—මෙම තනතුරු සථිරය. විශ්‍රාම වැටුප් සහිතය

**6. සේවා කොන්දේසි.**—(i) මෙම පත්වීම් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත් වේ.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින් හට ක්ෂෙත්‍ර නිලධාරීන් වශයෙන් රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින හා ඉරිදා දින නිවාඩු දිනයන් වශයෙන් සැලකිය නොහැකිය. එහෙත් තම රාජකාරි කටයුතු නොකඩවා කරගෙන යෑම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීමෙන් පසු කිසියම් දිනක් හෝ කිසියම් දිනක කවර වේලාවක හෝ නිවාඩු ලබාගත හැකිය.

7. සෑම අපේක්ෂකයෙකුම සිය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (බව්තිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ) ;

(ii) අධ්‍යාපන හා සෙසු සුදුසුකම් පිළිබඳ උසස්තම සහතිකපත්වල පිටපත් ;

(iii) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර 3ක පිටපත් (මෙම උප වගන්තිය යටතේ දැනටමත් රජයේ සේවාවෙහි නියුක්ත අපේක්ෂකයන්ගේ චරිත සහතික පත්‍ර අපේක්ෂා නොකෙරේ).

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාළවන පොදු කොන්දේසි කියවා බලන්න.

9. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වන සේ පිළියෙල කර ගත් අයදුම් පත්‍ර 1960 සැප්තැම්බර් මස 5 වැනි දින හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ලැබෙන සේ එවිය යුතුයි. එවැනි ඉල්ලුම් පත්‍ර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි. මේ සඳහා විශෙෂ ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

කේ. ඇන්. වීරක්කොඩි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවටය.

1960 අගෝස්තු මස 19 දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පස් සංරක්ෂණ සහායක තනතුරු පිළිබඳ අයදුම් පත්‍රයේ ආකෘතිය

(1) සම්පූර්ණ නම හා ලිපිනය :————.

(2) ජාතිය :————.

(3) උපන් දිනය හා වයස (1960 සැප්තැම්බර් මස 5 වැනි දිනට) : ————.

(4) උපන් ස්ථානය—

(අ) අයදුම්කරුගේ :————.

(ආ අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(5) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විෂයයන් ද සඳහන් කරන්න) : ————.

(6) කෘෂිකර්ම විද්‍යාලීය සහතිකපතක් ඔබ ලබා ඇත්තෙහිද ? ————.

(7) දැනට කරන රක්ෂාව :————.

(8) අමුනා ඇති චරිත සහතික පත්‍ර ගණන :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### දෙවැනි ශ්‍රේණියේ පර්යේෂණ සහායක තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දෙවැනි ශ්‍රේණියේ පර්යේෂණ සහායක තනතුරු හතරක් සඳහා ඉල්ලුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිපත්‍රය අනුව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත්‍ර 1960 සැප්තැම්බර් මස 3 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ මා වෙත එවිය යුතු ය. ආකෘතිපත්‍ර සපයනු නො ලැබේ.

2. වැටුප.—මෙම තනතුර සඳහා ඇති වැටුප් ක්‍රමය අවුරුද්දකට රු. 1,020—120 බැගින් වැඩිවීම් 15—2,820 වේ. (කාර්යක්ෂමතා කඩඉම් රුපියල් 1,620 ට හා රුපියල් 2,220 ට පෙර).

3. සේවා කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. මෙම පත්වීම් පළමුකොට ම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ.

(ආ) සාමාන්‍යයෙන් තෝරා ගත් අයදුම්කරුවන්ට කොළඹ නගරයේ සේවය කරන ලෙස නියෝග කරනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක් ම පහත දැක්වෙන කරුණු පිළිබඳ සතුටුදායක සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය :—

(අ) 1960 සැප්තැම්බර් මස 3 වැනි දින වන විට වයස අවුරුදු 20 ට නො අඩු බව හා අවුරුදු 30 ට නොවැඩි බව ;

(ආ) යහපත් චරිතයක් ඇති බව ;

(ඉ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් ඇතිව සාමාර්ථය ලැබූ බව ;

5. අයදුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍රවලට පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) අමුණා එවිය යුතු ය :—

(අ) ලබාගත් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ආ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ බාර ගනු නො ලැබේ.) වයස ඔප්පු කිරීම පිණිස උප්පැන්නය ලියාපදිංචි කොට නැති අයදුම්කරුවන්ගෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් නිකුත් කරනු ලබන විශේෂ සහතික භාර ගනු ලැබේ.

(ඉ) සුදුසුකම්, චරිතය, හා මේ තනතුරට යෝග්‍යතාවය පිළිබඳ මෑතකදී නිකුත් කරන ලද සහතික තුනක්. (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් විසින් මේ උප වගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍ය ය.)

6. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මූලාරම්භයේ පළ කොට ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීමේදී අදාල වන පොදු කොන්දේසිවලට මෙයින් අවධානය යොමු කරමි.

නි. විජේවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1960 අගෝස්තු මස 12 දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500,
කොළඹ 1.

### ආකෘති පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දෙවැනි ශ්‍රේණියේ පර්යේෂණ සහායක තනතුරු සඳහා ඉදිරිපත් කරන අයදුම්පත**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලිපිනය :————.

(3) (අ) අයදුම්කරු උපන් දිනය සහ ස්ථානය :————.
(ආ) උපන් ස්ථානය :——
(i) අයදුම්කරුගේ පියා :————.
(ii) අයදුම්කරුගේ සීයා (පිය පක්ෂයේ) :————.
(iii) අයදුම්කරුගේ මුත්තා (පිය පක්ෂයේ) :————.
අයදුම්කරුගේ උපත ලංකාවේ සිදුවුනි නම් (ආ) (i) හෝ (ii) සහ (iii) පිරවිය යුතුය. ඔහුගේ උපත ලංකාවේදී සිදු නොවීණි නම් (ආ) (i) සහ (ii) හෝ (3) පිරවිය යුතුය.

(4) ජාතිය :————.

(5) අයදුම්කරු විවාහකද, අවිවාහකද නැතහොත් වැන්දඹුවෙක්ද යන බව :————.

(6) අධ්‍යාපන සුදුසුකම් (සාමාර්ථය ලැබූ විෂයයන් සඳහන් කරන්න.) :————.

(7) පස් පර්යේෂණ වැඩ සම්බන්ධව පළපුරුද්දක් ඇතහොත් ඒ බව (සහතිකවල පිටපත් අමුණන්න.) :————.

(8) දැනට යම් තනතුරකට පත්වී සිටීනම් ඒ බව (එය තාවකාලිකද ස්ථිරද යන බව) :————.

(9) සහතික ඉදිරිපත් කර ඇත්තේ කවරකුගෙන්ද යන වග :————.

මා විසින් මේ අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද නිවැරදි බවද මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණොත් මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවද පත්වීමට පසු දැන ගන්නට ලැබුණොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————,
දිනය :————.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### II වැනි පන්තියේ ෆෝර්මන් තනතුර

තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ මෝටර් රථ ප්‍රවාහණ අංශයේ II වැනි පන්තියේ ෆෝර්මන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගැනීම 1960 සැප්තැම්බර් මස 30 වැනි දින අවසන් කරනු ලැබේ.

සම්පූර්ණ විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළකිරීම් (ඉංග්‍රීසි) බලනු මැනවි.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය,
ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ 1.

---

## පානදුරය, වේයන්ගොඩ හා ජාඇල අතර ස්වයංක්‍රිය වර්ණ ආලෝක සංඥාදීම හා රිය ගමනාගමන පාලනය

ඉහත දැක්වෙන වැඩ පිළිවෙළ සඳහා I වෙනි II වැනි ශ්‍රේණිවල, (තාවකාලික) ෆෝර්මන් තනතුරුවලට ඉල්ලුම් පත් කැඳවේ.

2. ඉල්ලුම්කරුවෝ (අ) දුම්රිය ආරක්ෂක උපකරණ හා ටෙලිෆෝන් උපකරණ හා/හෝ ආණ්ඩුව හෝ එම උපකරණ වෙළඳාමෙහි අවුරුදු 10 ට නොඅඩු කාලයක් යෙදුනු පිළිගත් වෙළඳ සමාගමක් හෝ යටතේ බල ශක්ති යෙදීම හෝ සම්බන්ධයෙන් ප්‍රායෝගික අභ්‍යාස යක්ද, (ආ) 3ත් අවුරුද්දකට නොඅඩු කාලයක් ඒ කටයුතු පිළිබඳව වග කීමට පුද්ගලිකව බැඳී සිටි (ඇ) මනා ස්වභාවයේ පරීක්ෂණයක් හා ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් හොඳ සහතිකද ලත් අය විය යුත්තාහ.

3. 1960 සැප්තැම්බර් 2 වෙනි දා ප. ව. 4.30ට කලින් ඉල්ලුම් පත්‍ර ලං. දු. දෙ. සාමාන්‍යාධිකාරීතුමාගේ කාර්යාලයට ලැබෙන්නට ඉදිරිපත් කළ යුතුය. උවමනා වූනි නම්, ඒ සඳහා පත්කරන තේරීමේ මණ්ඩලයක් ඉදිරියට තමන්ගේ වියදමෙන් පැමිණෙන්නට අපේක්ෂකයෝ සූදානම් වී සිටිය යුත්තාහ.

4. ඉල්ලුම් පත්‍ර භාවිතයෙහි යා කර ඇති ෆෝරමයෙහි අන්දමට විය යුතුය. ආණ්ඩුවේ සේවයෙහි යෙදුනු නිලධාරින්ගේ ඉල්ලුම් පත්‍ර තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගින්ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ ඉල්ලුම් පත්‍ර තම තමන්ගේ උප දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින්ද ඉදිරිපත් කළ යුතුව ඇත.

5. දිවයිනේ ඕනෑම තැනක සේවයට සුදුසු බව නියම කැරෙන දෘෂ්ටි පරීක්ෂණයක් ඇතුළු වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට යටත් කර, කෙටි කාල නිවේදනයකින්, තෝරාගත් අපේක්ෂකයින්ට පත්වීම දෙනු ලැබේ. දැනට ආණ්ඩුවේ ස්ථිර තනතුරු දරණ සේවකයින් තෝරා ගනු ලැබුවහොත් පත්කරන්නේ මෙම නිලවලට තාවකාලිකවය. ඔවුන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම් ආරක්ෂා කැරේ.

6. තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් විසින් රාජ්‍ය සේවා ඇප ආඥාපනත අනුව රු. 2,000 ඇපයක් තැබිය යුතුවේ.

7. තනතුරට අදාළ පඩි ක්‍රමය මෙසේය :—

I වැනි ශ්‍රේණිය — රුපි. 3,900 — 180 — 5,340.

II වැනි ශ්‍රේණිය — රුපි. 1,860 — 120 — 3,780.

I වැනි හෝ II වැනි හෝ ශ්‍රේණිවලට පත්කැරෙන්නේ සුදුසුකමත්, පළපුරුද්දත් සම්මුඛ පරීක්ෂා මණ්ඩලයේ මතයක් අනුව මය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසිවලට අවධානය යොමු කැරේ.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

1960 අගෝස්තු මස 10 වැනි දින,
තැ. පෙ. 355,
කොළඹ දීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**තාවකාලික පෝර්මන් තනතුරු සවයංක්‍රිය වර්ණ ආලෝක සංඥා සහ රිය ගමනා ගමන පාලන ක්‍රමය**

1. සම්පූර්ණ නම :————.
2. උපන් දිනය :————. 1960 සැප්තැම්බර් 2 වෙනි දිනට වයස අවු :————. මාස :————.
3. දැනට නියුක්ත රැකියාව සහ එහි ලිපිනය :————.
4. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග) :————.
5. කාර්මික සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.
6. පළපුරුද්ද (සවිස්තරව දිය යුතුයි) :————.

මා දක්වූ තොරතුරු සත්‍ය බවට සහතික කරමි. යම්කිසි තොරතුරක් අසත්‍ය ලෙස ඔප්පුවුවහොත් දඬුවම් විඳීමටද ඉඩ ඇති බැව් පිළිගණිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන,

වි. ද.—ඉල්ලීම් පත තමන්ගේ අත් අකුරෙන් නිවැරදි ලෙස හා පැහැදිලි විය යුතුයි.

### සංශෝධනය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරුවන්ගේ තනතුරු**

1960 අගෝස්තු මස 12 වැනි දින අංක 12,182 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේI වන සිංහල කොටසේ (II) වැනි ඡේදයේ 600 පිටුවේ ඇති ආධුනික සැලසුම්කරුවන් ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවා පළවූ දැන්වීම සම්බන්ධයෙනි.

එම දැන්වීමේ 3 වෙනි ඡේදයේ (අ) ශීර්ෂයේ "අවුරුදු 25 වත් අතර බව" යන කොටස "අවුරුදු 24වත් අතර බව" යනුවෙන් වෙනස් විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නී. විජේවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1960 අගෝස්තු මස 16 දින,
කොළඹ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/23/4/4 (ජී).

අංකය 12, 162 හා 1960 ජූලි 22 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1960 ජූලි 16 වැනි දින දරන ගැසට් නිවේදනය හා සම්බන්ධයි. සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වෙනි ශ්‍රෙණියට අයත් පහත නම් සඳහන් අපෙක්ෂකයා ද සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ වාර්තාවේ "සී" උපග්‍රන්ථයේ නියම කොට ඇති සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් දැන් සමර්ථ වී ඇති බව මෙයින් දැනුම් දෙමි:—

නම : සැල්ඩින්, ටී. ඒ.

දෙපාර්තමේන්තුව : අල්ලස් කොමසාරිස්ගේ

ඟ. ඵ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වෂී 1960ක්වූ අගෝස්තු 8 දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේදීය.

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ1), 60.10.1 සිට 61.9.30 දින තෙක් ඉවත ලන කඩදාසි මිලයට ගැනීම සඳහා 1960 සැප්තැම්බර් 13 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 12 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 19 වැනි දින,
කොළඹදීය.

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), පීක් කැප් තොප්පි සැපයීම සඳහා 1960 ඔක්තෝබර් 4 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ඔක්තෝබර් 3 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 19 වැනි දින,
කොළඹදීය.

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), 1960. 10. 1 සිට 61. 9. 30 තෙක් ඇඳුම් මැසීම සඳහා 1960 සැප්තැම්බර් 13 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 12 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 19 වැනි දින,
කොළඹදීය.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1), ගැල්වනයිස් යකඩ පයිප්ප සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 6 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 5 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 19 වැනි දින,
කොළඹදීය.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ඩී. එල්. එෆ්. ටෙන්ඩර් දැන්වීමයි

1960 ජූලි 29 වැනි දින අංක 12,169 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි සඳහන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ෂොප් ලුබ්‍රිකේටිං යුනිට් ආදී කරුණු 5ක් හා මෝටර් ඇනලයිසරයක් ආදී කරුණු 4ක් සැපයීම සඳහා වූ පිළිවෙලින් අංක ඩී. එල්. එෆ්. 50 හා ඩී. එල්. එෆ්. 51 දරණ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වන්නේ 1960 ඔක්තෝබර් 5 වැනි දින පෙරවරු 9.30 නොව එදින පෙරවරු 11 ට බව කරුණාවෙන් සලකන්න.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 15 වැනි දින,
කොළඹ 2.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

1960 ජූලි 29 වැනි දින අංක 12,169 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි සඳහන්, ලංකා විශ්ව විද්‍යාලයට ලෝහ ජනේල සැපයීම සඳහා වූ අංක අයි. සී. ඒ. 285 දරණ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වන්නේ 1960 සැප්තැම්බර් 28 වැනි දින පෙරවරු 9.30 ට නොව එදින පෙරවරු 11 ට බව කරුණාවෙන් සලකන්න.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 15 වැනි දින,
කොළඹ 2.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් 18 වැනි දින පෙරවරු 10 දක්වා මැලේරියා මර්දන ව්‍යාපාරයට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංකය |
|---|---|
| 1. සූක්ෂම දශික වීදුරු පතුරු ... | අයි. සී. ඒ. 280. |
| 2. ට්‍රක් රථ, ටොන් 3½ ... | අයි. සී. ඒ. 283. |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරිතැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 15 වැනි දින,
කොළඹ 2.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් 12 වැනි දින පෙරවරු 11 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ස්ටේෂන් වැගන් වර්ගයේ රථ (ටෙන්ඩර් අංක අයි. සී. ඒ. 286) සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1960 ඔක්තෝබර් 13 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින්, ඒ සඳහා පැමිණ සිටීමට කැමති ටෙන්ඩර්කරුවන්ට එසේ කළ හැක.

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරීතැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 15 වැනි දින,
කොළඹ 2.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ඩී. එල්. එෆ්. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1960 ඔක්තෝබර් 12 වැනි දින පෙරවරු 11 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1960 ඔක්තෝබර් 13 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින් ඒ සඳහා පැමිණ සිටීමට කැමති ටෙන්ඩර්කරුවන්ට එසේ කළ හැක :—

| ද්‍රව්‍යය | ටෙන්ඩර් අංකය |
|---|---|
| 1. බ්‍රේක් හැරවීමේ හා මට්ටම් කිරීමේ ලියවන පට්ටලයක් ආදී කරුණු 3ක් ... | ඩී. එල්. එෆ්. 54. |
| 2. සිදුරු ලොකු කිරීම සඳහා සෘජු—විදින යන්ත්‍රයක් ආදී කරුණු 6ක් ... | ඩී. එල්. එෆ්. 55. |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරීතැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අගෝස්තු 15 වැනි දින,
කොළඹ 2.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පලාතේ පොලොන්නරුවේ ප්‍රධාන හබරන-මඩකලපු පාරේ සිට වාරිමාර්ග කාර්යාලයට හා නව නගරයටවූ ප්‍රවේශ මාර්ගයේ 3 වෙනි සැතැප්මෙහි ගල් දමා තාර දැමීම සඳහා ඉදිරිපත් කරණු ලබන ටෙන්ඩර් අයැදුම් පත්, කොළඹ තැ. පෙ: අංක 500 මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් මස 13 වෙනි අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග, දුම්රිය සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවලින් එකක රු. 55,000ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවනට මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. පොලොන්නරුව ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම අනුපිටපතක් සමග දුරවා ඉදිරිපත් කළ යුතුයි.

රුපියල් 100ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුල 1960 සැප්තැම්බර් මස 9 වෙනි සිකුරාදාට පෙර පොලොන්නරුවේ

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. මේ ගැන වැඩිදුර විස්තර ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂතැන වෙනුවට.

1960 අගෝස්තු මස 11 වෙනි දින,
කොළඹදී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පලාතේ පොලොන්නරුවේ ඞී/1 ප්‍රධාන පාරේ 3 වෙනි සැතැප්මෙහි ගල් දමා තාර දැමීම සඳහා ඉදිරිපත් කරණු ලබන ටෙන්ඩර් අයැදුම් පත්, කොළඹ තැ. පෙ. අංක 500 මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් මස 13 වැනි අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග, දුම්රිය සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවලින් එකක රු. 60,000ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවනට මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. පොලොන්නරුව ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම අනුපිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුයි.

රුපියල් 100ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුල 1960 සැප්තැම්බර් මස 9 වැනි සිකුරාදාට පෙර පොලොන්නරුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. මේ ගැන වැඩිදුර විස්තර ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂතැන වෙනුවට.

1960 අගෝස්තු මස 11 වෙනි දින,
කොළඹදී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පලාතේ පොලොන්නරුවේ හිඟුරක්දමන පාරේ 3 වෙනි සැතැප්මෙහි ගල් දමා තාර දැමීම සඳහා ඉදිරිපත් කරණු ලබන ටෙන්ඩර් අයදුම් පත්, කොළඹ තැ. පෙ. අංක 500 මහාලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් මස 13 වැනි අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග, දුම්රිය සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවලින් එකක රු. 60,000ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවනට මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. පොලොන්නරුව ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම අනුපිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුයි.

රුපියල් 100ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුල 1960 සැප්තැම්බර් මස 9 වෙනි සිකුරාදාට පෙර පොලොන්නරුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. මේ ගැන වැඩිදුර විස්තර ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂතැන වෙනුවට.

1960 අගෝස්තු මස 11 වෙනි දින,
කොළඹදී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 8, කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ තුම්මෝදර අමුණ සෑදීම සඳහා 1960 සැප්තැම්බර් මස 13 වෙනි අඟහරුවාදා පෙරවරු 11.30 වනතුරු ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් මුද්‍රා තැබූ කවර වල බහා ඉදිරිපත් කළ යුතුයි. කළ යුතු වැඩ පිළිබඳ විස්තර රත්නපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට හෝ ඊට වැඩි මුදලකට හෝ ලියාපදිංචි වී ඇති රු. 25ක් ටෙන්ඩර් සඳහා කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත්කරුවන්ට 1960 අගෝස්තු මස 22 වෙනි දින සිට 1960 සැප්තැම්බර් මස 10 වෙනි දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබා ගත් සහතිකයක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතුයි.

කරුණු නොවිමසා එකක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ යම් ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය රජය සතුයි.

සී. කණගසුන්දරම්,
රත්නපුර උප කොටශ භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

1960 අගෝස්තු මස 6 වෙනි දින,
රත්නපුර වාරිමාර්ග කාර්යාලයේ දී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් රත්නපුර වාරිමාර්ග උප කොට්ඨාශය තුළ රජයේ ගබඩා ද්‍රව්‍ය එහා මෙහා ගෙන යෑම සඳහා 1960 සැප්තැම්බර් මස 13 වෙනි අඟහරුවාද පෙරවරු 11.30 වනතුරු ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. කළයුතු වැඩ පිළිබඳ විස්තර රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැක.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 10,000කට හෝ ඊට වැඩි මුදලකට හෝ ලියාපදිංචි වී ඇති රුපියල් විසිපහක් ටෙන්ඩර් පත්‍රිකා සඳහා කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 1960 අගෝස්තු මස 22 වැනි දින සිට 1960 සැප්තැම්බර් මස 10 වැනි දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරින්ගෙන් ලබා ගත් සහතිකයක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතුයි.

කරුණු නොවිමසා එකක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ යම් ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය රජය සතුයි.

සී. කණගසුන්දරම්,
රත්නපුර උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960 අගෝස්තු මස 1 වෙනි දින,
රත්නපුර වාරිමාර්ග කාර්යාලයේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ. 8, කෝට්ටේ පාරේ, බටහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගමනාගමන මධ්‍යස්ථානයේ පාරක් තැනීම සඳහා රු. 15,000කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 සැප්තැම්බර් මස 13 වෙනි අඟහරුවාදා පෙරවරු 11.30 දක්වා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ලියාපදිංචි කළ තැපැලෙනි. ලියුම් කවරයේ වම් කෙළවරෙහි පැහැදිලිව "ගමනාගමන මධ්‍යස්ථානයේ පාරක් තැනීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 8. කෝට්ටේ පාරේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි.

කොළඹ 5, ජාවත්ත පාරේ පිහිටි ගොඩනැගිලි උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයයෙන් 1960 සැප්තැම්බර් මස 9 වෙනි දින පස්වරු 4.30 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනුපිටපතක් ද සමගය. වැඩි විස්තර හා සැලැස්ම එහිදී බලාගත හැකිය.

ඕනෑම කච්චේරියක හෝ පහත සඳහන් කාර්යාලයයේ හෝ රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග තම සුදුසුකම් ඉදිරිපත් කරන අයට පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනටමත් රජයේ කොන්ත්‍රාත් වැඩලබා තිබෙන අය එම වැඩය සතුටුදායක අන්දමින් කර ගෙන යන බවට එම වැඩය භාර නිළධාරීන් ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍ර ලබාගැන්මේදී ඉදිරිපත් කළ යුතුයි.

වී. කුමාරස්වාමි,
ගොඩනැගිලි උප කොට්ඨාශය භාර,
වාරිමාර්ග ඉංජිනේරු තැන.

ගොඩනැගිලි උප කොට්ඨාශය භාර,
වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායභීලයය,
ජාවත්ත පාර, කොළඹ 5,
1960 අගෝස්තු මස 13 වෙනි දින දීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960.9.14 වැනි බදාදා පෙරවරු 10 දක්වා මිණිපෙ උප කොට්ඨාශයට අයිති බඩු බාහිරාදිය මධ්‍යම පළාත ඇතුළත ගෙන යෑම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 10,000 හා ඉන් ඉහළ ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පිටපත් දෙකකින් යුක්ත ටෙන්ඩර් පත්‍ර මිණිපෙ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩ පිළිබඳ සියලු විස්තර එම කායභීලයෙන් ලබාගත හැක.

3. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව සිටින අය විසින් එම වැඩ ප්‍රමාණය ගැනද ඒවා සතුටුදායක අන්දමින් කරගෙන යන බවද ඒ ඒ වැඩ භාර නිලධාරීන් ගෙන් සහතික ලබාගෙන ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

4. මිණිපෙ වාරිමාර්ග කායභීලයේ හෝ කච්චේරියේ රු. 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1960.8.22 දින සිට 1960.9.9 දින දක්වා රාජකාරියට නියමිත දිනයන් හි සවස 4.30 දක්වා මිණිපෙ වාරිමාර්ග කායභීලයෙන් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

පී. වී. ධර්මපාල,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මිණිපෙ උ. කො.

වාරිමාර්ග කායභීලය,
මිණිපෙ. 1960.8.10 වැනි දිනදීය.

## වාරිමාගී දෙපාතීමේන්තුව

දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තුමා විසින් ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාගී ඉංජිනේරු තැනගේ බඩු ගබඩාවට, (1) කහවත්තේ දුම්රිය බඩු ගබඩාවේ සිට ඇඹිලිපිටිය සහ අම්බලන්තොට දුම්රිය බඩු ගබඩාවේ සිට ඇඹිලිපිටිය දක්වා බඩු ගෙනයාම සඳහා 60.9.13 දින පෙරවරු 10 දක්වා මෙම දෙපාර්තමේන්තුවේ රු 15,000ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ ලොරි හිමි කොන්ත්‍රාත් කරුවන් ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් දෙකක් එක කොන්ත්‍රාත් කරුවකු විසින් යැවිය යුතුයි. ටෙන්ඩර් පිටපත් සහ මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියළු විස්තර ඇඹිලිපිටියේ වාරිමාගී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

3. මෙම දෙපාතීමේන්තුවේ ලියාපදිංචි කරණ ලද ලොරිහිමි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1960 සැප්තැම්බර් 5 වෙනිදා සිට 10 වෙනිදා දක්වා (දෙදිනම ඇතුළුව) ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. මෙම ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා කච්චේරියක රු. 25 (විසිපහක්) තැන්පත් කොට ලබාගත් කුවිත්තාන්සිය සහ තමාගේ ලියා පදිංචි කරණ ලද පොතද ඉදිරිපත් කළයුතුයි. දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් කරගෙනයන අය එම වැඩ සතුටුදයක අන්දමට කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරීන් ගෙන් ඒ වගට සහතියක්ද ඉදිරිපත් කළයුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ හෝ කොටසක් හෝ පිළිගැණීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උපකොට්ඨාශය භාර
වාරිමාගී ඉංජිනේරු තැන.

වාරිමාගී කායභීලය,
ඇඹිලිපිටිය,
1960.8.9.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ත්‍රිකුණාමල උප කොට්ඨාශය

1960වේ ජූලි මස 15 වෙනිදා ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවී ඇති දැන්වීම පරිදි, ත්‍රිකුණාමලයේ, මොරවැව යෝජනා ක්‍රමයේ වැකන්දේ උඩපැත්තේ රළු පනාවට කළුගල් දැමීම සඳහා ටෙන්ඩර් පත් භාරගැනීම 1960. 8. 31 වැනි බදාදා පෙරවරු 10 දක්වා කල් දී තිබේ. 1960. 8. 29 වැනි දිනය දක්වා ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

කේ. සිවසුබ්‍රමනියම්,
ත්‍රිකුණාමලය උප කොට්ඨාශය භාර,
වාරිමාර්ග නිලධාරි තැන.

## වාරිමාගී දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 31 වෙනි දින පෙ. ව. 9.30 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනාඔය ජලාශ ව්‍යාපාරය යටතේ රජයේ බඩු එහා මෙහා ගෙනයෑම සඳහා ටැන්ඩර් භාර ගනු ලැබේ.

2. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාගී ඉංජිනේරු තැනගෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකක ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ඊට අදාල සියළුම තොරතුරු එම වාරිමාගී ඉංජිනේරුතැනගෙන් විමසා දැනගත හැක.

3. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාගී ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1960 අගෝස්තු මස 30 වෙනි දින දවල් 12 දක්වා පමණි. මෙම වැඩය සඳහා ටැන්ඩර් එවිය හැක්කේ මෙම දෙපාර්තමේන්තුවේ රු. 10,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත් කරුවනට පමණකි. ටැන්ඩර් පෝර්ම ලබාගැනීමේ දී රු. 25ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල වාරිමාගී අධ්‍යක්ෂක තැන වෙනුවෙන්, කච්චේරියේ තැන්පත් කළ හැක.

කේ. වෙල්වරාජ්,
වාරිමාගී ඉංජිනේරු තැන,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

වාරිමාගී කායභීලය,
මකුල්පොත.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශය භාර අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් සේවාවන් සඳහා වෂී 1960ක්වූ සැප්තැම්බර් මස 14 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

| මෙහෙය පිළිබඳ විස්තර | | ලියා පදිංචිකොට ඇති ප්‍රමාණය | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|
| උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරයේ දකුණු ඉවුරේ | | | | රු. ශ. |
| ප්‍රධානඇලෙහි යෝජිත හරස් අතුරක් ඉදිකිරීම | | 50,000 | ... | 50 00 |
| අංගමුව වැවෙහි වානෙහි අත්තිවාරම ඉදිකිරීම | ... | 45,000 | ... | 50 00 |

2. මෙහි ඉහත සඳහන් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ප්‍රමාණයකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන් මේ සඳහා ටෙන්ඩර් දැමීමට සුදුස් සෝ වෙති.

3. ටෙන්ඩර් පත්‍රය තඹුත්තේගම රාජංගන උප කොට්ඨාශයෙහි වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා අවශ්‍ය වැඩි විස්තර තඹුත්තේගම රාජංගන වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර වෂී 1960 අගෝස්තු මස 20 වෙනි දින සිට වෂී 1960 සැප්තැම්බර් මස 12 වෙනි දින දක්වා කාර්යාලීය වැඩ කරන කාලය තුළදී මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ටී. ආර්. ද සිල්වා,
රාජංගන උප කොට්ඨාශයේ වාරිමාර්ග
ඉංජිනේරු තැන.

වෂී 1960 අගෝස්තු මස 6 වෙනිදා,
වාරිමාර්ග කාර්යාලය, තඹුත්තේගම.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

අනුරාධපුරයෙහි උතුරු මැද කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා වෂී 1960ක්වූ සැප්තැම්බර් මස 14 වන බුදදින පස්වරු 2.30 දක්වා පදවිය ව්‍යාපාරයේ අටවන යායේ බෙදුම් ඇලවේලි පාර වල්වලට බොරලු දැමීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම වැඩය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් දැමීමට සුදුස්සන් වෙත්.

3. අනුපිටපතකින් යුක්තවූ ටෙන්ඩර් පත්‍රිකා පදවිය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගතයුතු අතර මේ සම්බන්ධ සියලු විස්තර එම කායභීලයෙන් ලබාගත හැක. තවද ලාංකිකයන් සහ ලාංකික වෙළඳ සමාගම් පමණක් ටෙන්ඩර් දැමීමට සුදුස්සන් වෙත්.

## ධීවර දෙපාර්තමේන්තුව

### රෙදි සේදීම

රෙදි සේදීම සඳහා 1960 සැප්තැම්බර් මස 14 වැනි දින පෙරවරු 10.30 දක්වා තුන්වන කොළඹ ගාළු මුවදොරදී ධීවර අධ්‍යක්ෂ තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් 25කි.

ඩී. ව්. ඊ. ඒ. ද ෆොන්සේකා,
ධීවර අධ්‍යක්ෂ.

1960 අගෝස්තු 11 වැනි දින,
කොළඹ, ගාළුමුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේදීය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

(1) **ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1960 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන, ආයතනයන්ට, දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල/ආණ්ඩුවේ ගොවිපලවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සිල් තැබූ ටෙන්ඩර්පත්‍ර, කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ දී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ..

(2) i. **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු. 100ක තැන්පත් මුදලක්, මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

සැ. යු.—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කායඨාලයෙන් ලබාගත හැක.

ii. **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙමම කායඨාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කායඨාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම් සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

(3) **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

(4) **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමග ඇති උපලෙඛනයෙහි 3 වැනි තීරය බලන්න.

(5) **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලයය, ගාලු මුවදොර, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායඨාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

(6) **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලෙඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

(7) **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකු ගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

(8) **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළවමුන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(9) **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලෙඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දුපත්‍රය අත්සන් කළ යුතුය.

(10) **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

(11) **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලය,
කොළඹ, 15.8.60.

### 4 වැනි ලේඛනය සම්බන්ධයි

**අනුරාධපුර කොට්ඨාශය**

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>යැවිය හැකි ප්‍රමාණය | 4<br>අවසාන දිනය |
|---|---|---|---|
| අනුරාධපුර දුම්රිය පොළේ සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඨාලයට සහ අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඨාලයේ සිට ඔහුගේ පාලනය යටතේ පවතින කිරි මධ්‍යස්ථානවලට | අනුරාධපුරය ... | 13,020 | 14.9.60 |
| **කොළඹ කොට්ඨාශය** | | | |
| වල්පිට රජයේ ගොවිපළේ සිට කොච්චිකඩේ සෞඛ්‍ය කායඨාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කොච්චිකඩේ ... | 2,750 | 14.9.60 |
| **යාපනය කොට්ඨාශය** | | | |
| කෝප්පේ සෞඛ්‍ය කායඨාලයේ සිට කෝප්පේ සෞඛ්‍ය කායඨාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කෝප්පේ ... | 6,594 | 14.9.60 |

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහාමෙහා ගෙනයාම

1960 ඔක්තෝබර් 1 වෙනි දා සිට 1961 සැප්තැම්බර් 30 වෙනි දසින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ ටෙන්ඩර් පිළිබඳ විස්තර දන්වා ඇති පිටිකිරි සහ සීනි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාලවල සහ ගබඩාවල සිට/සෞඛ්‍ය කායඨාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කායඨාල සහ ගබඩාවල සිට දිස්ත්‍රික් පරිපාලනවරයින්ගේ කායඨාල සහ ගබඩාවල සිට/දුම්රිය ස්ථානවල සිට/පිටිකිරි සහ සමුපකාර සංගම්වල සිට/සීනි, කිරි මධ්‍යස්ථානවලට උපලේඛනයේ සඳහන් එක් එක් සේවය සඳහා වෙන වෙන ම සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, කොළඹ

සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ තැන විසින්, ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෛද්‍ය සමාගම්වලින් භාරගනු ලැබේ.

2. (I) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලෙඛනයෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු. 100ක් තැන්පත් මුදලක්, මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

**සැ. යු.**—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කායඖලයෙන් ලබාගත හැක.

(II) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කායඖලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කායඖල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලෙඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ, "බී" අක්‍ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කායඖලයය, ගාලු මුවදොර, කොළඹ." කියා එවිය යුතුයි. සීල් කරනලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාත් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරු ගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායඖලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරනලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙළ කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්‍ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරනලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශෙෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලෙඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කායඖලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ වෙනුවට.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, ගාලුමුවදොර,
මහලේකම් කායඖලය, කොළඹ.
15 8 60.

## උපලේඛනය

| 1 | 2 | 3 | | 4 |
|---|---|---|---|---|
| සේවය | ප්‍රදේශය | පිටි හා කිරි ප්‍රමාණ දළ වශයෙන් | | අවසන් දිනය |
| | | පිටි හො. | කිරි හො. | |
| **නුවර කොට්ඨාශය** | | | | |
| රඹුක්කන දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ වැරැල්ලේගම තුම්පනේ හාරිස්පත්තු සමුපකාර සංගමයේ සිට සීනි, ගලගෙදර සෞඛ්‍ය කායඖලයට සහ ගලගෙදර සෞඛ්‍ය කායඖලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... | ගලගෙදර ... | 9 ... | 3 | 14.9.60 |
| කඩුගන්නාව දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ දෙනුවර සමුපකාර සංගමයේ සිට සීනි, කඩුගන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායඖලයට සහ කඩුගන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... | කඩුගන්නාව ... | 15½ ... | 6 | 14.9.60 |
| කටුගස්තොට දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ හාරිස්පත්තු සහ තුන්පනේ සමුපකාර සංගමයේ සිට සීනි, හාරිස්පත්තු සෞඛ්‍ය කායඖලයට සහ හාරිස්පත්තු සෞඛ්‍ය කායඖලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... | හාරිස්පත්තුව ... | 2 ... | 1 | 14.9.60 |
| ගම්පොල දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ උඩ පළාත සමුපකාර තොග ආයතනයේ සිට සීනි, ගම්පොල සෞඛ්‍ය කායඖලයට සහ ගම්පොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... ... | ගම්පොල ... | 20 ... | 5 | 14.9.60 |
| නාවලපිටිය දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ නාවලපිටිය සමුපකාර සංගමයේ සිට සීනි, නාවලපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායඖලයට සහ නාවලපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... | නාවලපිටිය ... | 12 ... | 5 | 14.9.60 |
| නුවර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ තෙල්දෙනිය සමුපකාර සංගමයේ සිට සීනි, උඩුදුම්බර දිස්ත්‍රික් පරිපාලකවරයාගේ ගබඩාවට සහ උඩුදුම්බර දිස්ත්‍රික් පරිපාලකවරයාගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... ... | උඩුදුම්බර ... | 23 ... | 8¾ | 14.9.60 |
| නුවර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ අම්පිටිය සමුපකාර සංගමයේ සිට සීනි, වත්තේගම සෞඛ්‍ය කායඖලයට සහ තලාතුඔය දිස්ත්‍රික් පරිපාලකවරයාගේ කොට්ඨාශයේ තිබෙන තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... ... ... | තලාතුඔය ... | 4 ... | 1½ | 14.9.60 |
| වත්තේගම දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ දුම්බර බටහිර සමුපකාර සංගමයේ සිට සීනි, වත්තේගම සෞඛ්‍ය කායඖලයට සහ වත්තේගම සෞඛ්‍ය කායඖලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... ... | වත්තේගම ...... | 2 ... | 1 | 14.9.60 |

## ආණ්ඩුවේ රස පරීක්‍ෂක දෙපාර්තමේන්තුවේ ඇසිඩ් වාෂ්ප පිටකිරීමේ කවුළු (ෆියුම් කබර්ඩ්) සවි කිරීම

ඉහත සඳහන් කාර්‍යය සඳහා ආණ්ඩුවේ රස පරීක්‍ෂකතැන විසින් වර්‍ෂ 1960 ක්වූ අගෝස්තු මස 26 දින පෙරවරු 10 දක්වා කොන්ත්‍රාත් කරුවන්ගේ මුද්‍රා සහිත ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. භාණ්ඩාගාරයේ හෝ කච්චේරියේ හෝ මෙම කාර්‍යාලයේ රු. 25 ක මුදලක් තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් මෙම කාර්‍යාලයෙන් ටෙන්ඩර් පෝර්ම පත්‍ර ලබාගත හැකිය. එම පෝර්ම අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුය.

3. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. ටෙන්ඩර් පත්‍ර එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ඇසිඩ් වාෂ්ප පිට කිරීමේ කවුළු සවිකිරීම" කියා සඳහන් විය යුතුය.

4. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර වැඩ කළ යුතු ස්ථාන පරීක්ෂා කර බලා ඒ පිළිබඳ ඇති අනුමාන කරුණු තහවුරු කරගත යුතුය.

5. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්‍ෂෙප කිරීමේ අයිතිය රජයේ රස පරීක්‍ෂකතුමා සතුව ඇත.

ජේ. ආ. කො. සිරිමාන්න,
ආණ්ඩුවේ රස පරීක්‍ෂක.

ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.

---

## නියෝජ්‍ය ආහාර පාලක තුමන්ගේ බඩු සැපයීමේ මධ්‍යස්ථානවලින් ප්‍රදේශයේ පාන් පුළුස්සන්නන් වෙත රාත්තල් 50යේ මිටිවල ඇහුරු "ඇදිහැස" පිටි ගෙනයාම

ඉහත සඳහන් සේවය සඳහා සීල් තබනලද පිටපත් දෙකකින් යුක්ත ටෙන්ඩර්පත්‍ර පොළොන්නරුවේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් 1960 සැප්තැම්බර් මස 15 වැනි දින පස්වරු 3 දක්වා භාරගනු ලැබේ.

2. පොළොන්නරුවේ ආධ්‍යාපන කාර්යාලයෙන් ලබාගතහැකි ටෙන්ඩර් පෝර්ම්වල එක් එක් සැපයීමේ මධ්‍යස්ථාන සඳහා වෙන වෙනම ටෙන්ඩර් රාත්තල් 50 යේ "ඇදිහැස" පිටි මිටියකට හැතැප්ම 1 කට යන වියදම අනුව පිළියෙල කළ යුතුවේ. ටෙන්ඩර් කරුවන්ට පොළොන්නරුව හා හිඟුරක්ගොඩ සැපයීමේ මධ්‍යස්ථානවල සිට ඒ අවට පදිංචි බේකරි කරුවන්වෙත පිටි ගෙනයාමට සිදුවේ. එක පාඨශාලා වාරයකට දෙවරක් බැගින් පිටි බෙදාදීමට සිදුවේ.

3. බෙදාහැරීමේ මධ්‍යස්ථාන—

(1) පොළොන්නරුව.

(2) හිඟුරක්ගොඩ.

4. වුවමනා කරන සියළුම විස්තර පොළොන්නරුවේ අධ්‍යාපන කාර්යාලයෙයෙන් ලබාගතහැක.

ඇම්. ඇස්. ද ඇස්. ජයසේකර,
අධ්‍යාපන නිලධාරිතැන—පොළොන්නරුව.

1960 අගෝස්තු මස 10 දින,
පොළොන්නරුවේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

---

## ආහාර දෙපාර්තමේන්තුව

වර්‍ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1961ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් 1960ක්වූ සැප්තැම්බර් මස 12 වෙනි සඳුදා පස්වරු 2.30 දක්වා කොළඹ, යූනියන් පෙදෙසේ (අංක 569 දරණ තැපැල් පෙට්ටිය) වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ (ආහාර අංශයේ) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

සේවය : කොළඹ වාප්පුවේ සහ චාමර්ස් ධාන්‍යාගාරයේ සිට ද, වැල්ලවත්ත, මාලිගාවත්ත, කොළොන්නාව, පැපිලියාන යනාදී ආහාර ගබඩාවන්හි සිටද පහත සඳහන් ප්‍රදේශයන්හි පිහිටි සපයන ස්ථානවලට සහ/හෝ සමුපකාර සංගමයන්ට ආහාර සහ කිරිපිටි ලොරිවලින් ගෙනයෑම.

ප්‍රදේශ අංක 1 : වේයන්ගොඩ, වරකාපොල, මීගමුව සහ ජාඇල

ප්‍රදේශ අංක 2 : කළුතර, අළුත්ගම සහ කරවනැල්ල

කොළඹ යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1960ක්වූ සැප්තැම්බර් මස 9 වෙනි සිකුරාදා දවල් 12 තෙක් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රුපියල් 250ක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුවත් හැර විස්තර ප්‍රකාශනයේ 2 දරණ ඡෙදයන්හි සඳහන් ලියවිලිද ඉදිරිපත් කළ යුතු වේ. මෙම විස්තර ප්‍රකාශනයද අමතර විස්තරද ආහාර කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960 අගෝස්තු 9 දින,
330, යූනියන් පෙදෙස, කොළඹ.

---

## ආහාර දෙපාර්තමේන්තුව

වර්‍ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1961ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් 1960ක්වූ සැප්තැම්බර් මස 12 වෙනි සඳුදා පස්වරු 2.30 දක්වා කොළඹ, යූනියන් පෙදෙසේ (අංක 569 දරණ තැපැල් පෙට්ටිය) වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ (ආහාර අංශයේ) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

සේවය : ගාලු වරායේ සිට බූස්සේ දිස්ත්‍රික්ක ධාන්‍යාගාරයට හාල්, පිටි, සීනි, කිරිපිටි සහ වෙනත් ආහාර ද්‍රව්‍ය ලොරිවලින් ගෙනයෑම.

කොළඹ යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1960ක්වූ සැප්තැම්බර් මස 9 වෙනි සිකුරාදා දවල් 12 තෙක් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රුපියල් 250ක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුවත් හැර, විස්තර ප්‍රකාශනයේ 4 (II) සහ (III) දරණ ඡෙදයන්හි සඳහන් ලියවිලිද ඉදිරිපත් කළ යුතු වේ. මෙම විස්තර ප්‍රකාශනය ද අමතර විස්තර ද ආහාර කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960 අගෝස්තු 9 දින,
330, යූනියන් පෙදෙස, කොළඹ.

---

## ආහාර දෙපාර්තමේන්තුව

වර්‍ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1961ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් 1960 ක්වූ සැප්තැම්බර් මස 12 වෙනි සඳුදා පස්වරු 2.30 දක්වා කොළඹ යූනියන් පෙදෙසේ (අංක 569 දරණ තැපැල් පෙට්ටිය) වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ (ආහාර අංශයේ) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

සේවය : කොළඹ වරායේ වාප්පුවල සිට චාමර්ස් ධාන්‍යාගාරයේ මැනිං වෙළඳ සැළේ, මාලිගාවත්තේ, කොලොන්නාවේ සහ පැපිලියානේ ආහාර කොමසාරිස්ගේ ගබඩාවලට ආහාර ද්‍රව්‍ය (ප්‍රධාන වශයෙන් හාල්, පිටි සහ සීනි) ලොරිවලින් ගෙන යෑම.

පළමු සඳහන් ආහාර ගබඩා දෙක හැරෙන්ට අනිකුත් ස්ථානයන්ට බඩු ටොන් එකක් හැතැප්මක් ගෙන යෑමටද එම දෙපළට බඩු ටොන් එකක් මුළු දුර ප්‍රමාණයම ගෙන යෑමට අය කරන ගාස්තු ප්‍රමාණයද සඳහන් කළ යුතු වේ. හාල් සාමාන්‍යයෙන් රාත්තල් 160වේ සහ 224රේ මිටි වලින් යුක්ත වේ. පිටි මිටියක සාමාන්‍ය බර රාත්තල් 150 ක් වේ. යටත් පිරිසෙයින් කුලී ලොරි 15 ක් සේවය සඳහා සැපයිය හැකි, ප්‍රවාහණ කටයුතුවල නියුක්ත වූවන්ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ. නියම කරනු ලබන පරිදි අතිරේක කුලී ලොරි සැපයීමටද ටෙන්ඩර්කරුට හැකිවිය යුතුය. තමන්ට ලබාගත හැකි රථ වාහනවලින්ම කොන්ත්‍රාත්තුව ඉටු කිරීමටද ටෙන්ඩර්කරුවන්ට හැකි විය යුතුයි

කොළඹ යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස්තැනගේ කාර්යාලයෙන් 1960ක්වූ සැප්තැම්බර් මස 9 වෙනි සිකුරාදා දවල් 12 තෙක් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රුපියල් 250ක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුවාත් හැර විස්තර ප්‍රකාශනයේ 4 (II) සහ (III) දරණ ඡෙදයන්හි සඳහන් ලියවිලිද ඉදිරිපත් කළ යුතු වේ. මෙම විස්තර ප්‍රකාශනයද අමතර විස්තරද ආහාර කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960ක්වූ අගෝස්තු මස 9 දින,
330, යූනියන් පෙදෙස, කොළඹ 2.

## ආහාර දෙපාර්තමේන්තුව

වර්ෂ 1960 ක්වූ ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1961 ක්වූ සැප්තැම්බර් මස 30 දින දක්වා කාලය තුල වේයන්ගොඩ දිස්ත්‍රික්ක ධාන්‍යාගාරයේ සේවයට කම්කරුවන් සැපයීම සඳහා ටෙන්ඩර් 1960 ක්වූ සැප්තැම්බර් මස 13 වෙනිදා පස්වරු 2.30 දක්වා කොළඹ යූනියන් පෙදෙසේ වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ (ආහාර අංශය) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

කොළඹ යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාල යෙන් 1960 ක්වූ සැප්තැම්බර් මස 12 වෙනිදා දවල් 12 තෙක් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රුපියල් 250 ක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළයුතු වේ. මේ සම්බන්ධව විස්තර ප්‍රකාශනයක් ආහාර කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. සුබ්‍රමානියම්,
ආහාර කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු 11 දින,
330, යූනියන් පෙදෙස,
කොළඹ.

---

## 1960-61 වර්ෂය තුළ ආහාර ද්‍රව්‍ය සහ “ කෙයාර් ” කිරිපිටි ගෙනයාම

1960 ඔක්තෝම්බර මස 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා යෙදෙන මුදල් වර්ෂයට, මන්නාරම් දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති මුරුන්කන් සැපයීම් ගබඩාවට ආහාර ද්‍රව්‍යයන් සහ “ කෙයාර් ” කිරිපිටි ගෙනයාම සහ පැටවීම සඳහා අලුත් ටෙන්ඩර් පත්‍ර මන්නාරමේ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් 1960 සැප්තැම්බර මස 2 වෙනි සිකුරාදා පූර්වභාග 10 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කරන විට එය පිටපත් දෙකකින් යුක්ත විය යුතුයි. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර මන්නාරම් කච්චේරියේ නියෝජ්‍ය ආහාර පාලක තැනගෙන් 1960 සැප්තැම්බර් මස 1 වෙනි බ්‍රහස්පතින්දා අපරභාග 4 දක්වා ලබාගත හැක. ආකෘති පත්‍ර ලබා ගැනීමේදී රුපියල් 50 ක (රුපියල් පනහක) තැන්පත් මුදලක් මන්නාරම් කච්චේරියේ තැන්පත් කර ඉන් ලැබෙන රිසිට් පත මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. මේ පිළිබඳ වැඩි විස්තර මන්නාරමේ නියෝජ්‍ය ආහාර පාලක තැනගෙන් දැනගත හැක.

ඇස්. පරමනාදන්,
නියෝජ්‍ය ආහාර පාලක තැන වෙනුවට.

1960 අගෝස්තු මස 15 වෙනි දින,
මන්නාරම කච්චේරියේ දීය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ, කොළඹ ශාඛාවල තිබෙන **පාවිච්චි කරන ලද** හිස් ගෝනි සහ හිස් ටින් මිල දී ගැනීම සහ ගෙන යාම පිණිස ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ කොටුවේ, චැතැම් වීදියේ අංක 62 දරණ කාර්යාලයේ අලෙවිකිරීමේ කොමසාරිස් තැන විසින් 1960 සැප්තැම්බර් මස 13 වැනි අඟහරුවාදා අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ අලෙවිකිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 50ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960.9.13 වැනි අඟහරුවාදා දවල් 12 දක්වා අවශ්‍ය ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

වැඩි විස්තර අලෙවිකිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඩබ්ලිව්. සී. ඕ. තිලකරත්න,
අලෙවිකිරීමේ සංවර්ධන කොමසාරිස් වෙනුවට.

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව,
චැතැම් වීදිය, අංක 62 දරණ ස්ථානය,
කොළඹ 1.
1960. 8. 13 වැනි දින දී ය.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

පහත සඳහන් දුම්රිය ස්ථානයන්හි බඩු පැටවීම සහ බඩු බෑම සඳහා ලියාපදිංචි වූ ටෙන්ඩර්කරුවන්ගෙන් ගැනුම් යෝජනා පත් කොළඹ තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයේ ගැනුම් යෝජනා පත් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා දවල් 11 වනතුරු භාරගනු ලැබේ. මෙම සේවාව 1960 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට සම්පූර්ණ අවුරුද්දක කාල සීමාවක් සඳහා වලංගුව පවතී.

1. යාපනය සහ කන්කසන්තුරේ, 2. මාතලේ, 3. තලවාකැලේ සහ 4. නානුඔය.

දුම්රිය වාණිජ අධිකාරිතැනගේ කාර්යාලයෙන් පෝර්ම කොළ ලබා ගෙන ගැනුම් යෝජනා පත් පිළියෙල කොට අනුපිටපතක්ද සහිතව එවිය යුතුය. ගැනුම් යෝජනා පත්‍ර සඳහා තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 100 ක් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කොට ලබා ගන්නා ලද කුවිතාන්සිය ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් මස 10 වෙනි සෙනසුරාදා දවල් 12 වනතුරු ගැනුම් යෝජනා පත්‍ර පෝර්මයන් ලබාගත හැක.

“ විශෙෂ ” සහ “ සාමාන්‍ය ” විස්තර ප්‍රකාශනයන් සමග මෙම පත්‍රිකා වද ගැනුම් යෝජනා පත්‍ර සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කොළඹ තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයේ ගැනුම් යෝජනා පත්‍ර මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ගැනුම් යෝජනාකරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ දුම්රිය වාණිජ අධිකාරිතැන වෙත ගෙනවිත් භාරදිය හැක. එම ලියුම් කවරයෙහි ඉල්ලුම් කරන සේවය, නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. දුම්රිය වාණිජ අධිකාරි තැන එය වහාම ගැනුම් යෝජනා පත්‍ර බහාලන පෙට්ටියේ තැන්පත් කරන අතර ඒ වෙනුවෙන් කුවිතාන්සියක්ද නිකුත් කරනු ඇත. ඉහත සඳහන් කරන වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන ගැනුම් යෝජනා පත්‍ර භාරගනු නොලැබේ.

ගැනුම් යෝජනාකරුවන් කැමති නම් ගැනුම් යෝජනා පත්‍ර විවෘත කරන වේලාවට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරිතැනගේ කාර්යාලයේදී මෙකී ගැනුම් යෝජනා පත් භාර ගනු ලබන අවසාන දිනයේ එකී වේලාවට විවෘත කරනු ලැබේ.

තමන් විසින් ඉල්ලුම් කරනු ලබන සේවය භාර ගැනීම සඳහා ගැනුම් යෝජනා පත්‍ර භාර ගැනීමේ අවසන් දිනයේ සිට සති තුනක් ගැනුම් යෝජනාකරුවන් බලාපොරොත්තුවෙන් සිටිය යුතුය.

වැඩි විස්තර වාණිජ අධිකාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරි තැන.

තැ. පෙ. 355,
කොළඹ, 1960.8.15.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

1960 ඔක්තෝබර් මස 1 වැනිදා පටන් 1961 සැප්තැම්බර් මස 30 වැනිදා දක්වා තිල ඇඳුම් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 සැප්තැම්බර් මස 14 වැනි බදාදා පෙ. ව. 11 වන තෙක් භාරගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළ වල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 සැප්තැම්බර් මස 10 වැනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1960 සැප්තැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

සෑ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදී ය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

උතුරු මහනුවර දිස්ත්‍රික්ක ගරාජයේ කාර්යාලය ය, ගබඩාව ය, තෙල් කාමරය ය, වහල සහිත අභ්‍යන්තර මාර්ගය ය යන මේවා ඉදිකිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපතී මහතා විසින් 1960.9.7. වෙනි වෙනි දා පෙ.ව. 10

වනතෙක් බාරගනු ලැබේ. බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගෙන් වැඩි විස්තර අසාගත යුතුයි.

ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ නම් රුපියල් 75.000 ක් හෝ ඊට වැඩියෙන් වියදම් යන වැඩ කිරීමට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ පමණකි. ඔවුන් විසින් තම සහතික පත්‍ර පරීක්ෂාව හා අනුමත කිරීම පිණිස බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඒ ඉංජිනේරු මහතා ඒවා පිළිගත් පසු ඔවුන් විසින් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රුපියල් 200ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කළ යුතුයි.

මුදල් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට නියොජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා විසින් 1960.9.3 වෙනි දා වන තෙක් ටෙන්ඩර ලිපි නිකුත් කරනු ලැබේ. කොයි ටෙන්ඩර පත්‍රයත් ලියා එවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන ටෙන්ඩර පෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම් තැන.

1960 අගෝස්තු මස 11 වෙනි දිනදීය.

---

මගේ අංකය : අයි/පී කේ ඇස්/522/2.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුළු වාරිකම් වැඩ

පහත දක්වන වාරිකම් වැඩ සඳහා මෙම කච්චිරියෙන් ලබාගන්නා ලද ආකෘතිපත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1960 අගෝස්තු මස 26 වැනි දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ :—

1. කෙමන්කඩ බැම්ම ප්‍රතිසංස්කරණය,
2. යක්දෙස්සාව ඇල (දකුණ) ප්‍රතිසංස්කරණය,
3. යක්දෙස්සාව ඇල (උතුර) ප්‍රතිසංස්කරණය,
4. වැගල් හොරොව්ව වේල්ල ප්‍රතිසංස්කරණය.

එක එක වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් 1960 අගෝස්තු මස 25 වැනි දින පස්වරු 3 වන තුරු ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබාගත හැක. සමුපකාර ආයතන සහ ග්‍රාම සංවර්ධන සමිති ගණන යෝජනා ආකෘති පත්‍ර ලබා ගැනීමේදී මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නොවේ.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1960 අගෝස්තු මස 26 වැනි දින පෙ. ව. 10 ට පටන් ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම්කරුවනටද පෙනී සිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් හෝ විමසීමෙන් මගෙන් ලබාගත හැක.

පී. කේ. රාජරත්නම්,
පුත්තලමේ දිසාපති තැන වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
පුත්තලම් කච්චේරියේදීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

මාරවිල වීරහේනේ ගැහැණු ළමයින්ගේ ගොවිකම් පාසලක් සෑදීම සඳහා 1960 අගෝස්තු 12 වැනි දින අංක 12,182 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටෙන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960.8.15.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

ආනමඩුව ආරෝග්‍යශාලාවේ විදුලිබල මධ්‍යස්ථානය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 සැප්තැම්බර් මස 7 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පුත්තලම ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අගෝස්තු මස 26 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කායභාලයේදීය.
1960.8.15.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කුරුණෑගල, සඳගල සහ අරම්පොල වතුවල ඇති ගොඩනැගිලිවල විශේෂ අළුත්වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 සැප්තැම්බර් මස 7 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කුරුණෑගල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අගෝස්තු මස 26 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 11,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කායභාලයේදීය.
1960.8.15.

## බඩු බාහිරාදිය විකිණීම

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු දැනට සේවයට අයෝග්‍ය සී. වී. 3026 දරණ "ෆෝර්ඩ්" වර්ගයෙන් වෑන් රථය මහනුවර බන්ධනාගාරයේ ප්‍රධාන දොරටුව සමීපයේදී වර්ෂ 1960 අගෝස්තු මස 25 වෙනි දින සවස 2 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ රථය ලබාගත් අය විසින් වෙන්දේසිය අවසානයේදී මුදල් තැන්පත් කොට, රථය දින 3 කට මත්තෙන් ඉවත් කළ යුතුය.

කලින් දැන්වීමෙන් පසු, අවසර ලැබූ අයෙකුට මෙම රථය බෝගම්බර බන්ධනාගාර ගරාජයේදී පරීක්ෂා කළ හැකිය.

ඒ. ගුණසුන්දරම්,
බන්ධනාගාර අධිකාරි තැන.

බෝගම්බර බන්ධනාගාරය,
මහනුවර, 1960.7.27.

---

### ජාතික කිරි මණ්ඩලය

#### පාවිච්චියට සුදුසු හා නුසුදුසු බඩු බාහිරාදිය විකිණීම

පහත සඳහන් පාවිච්චියට සුදුසු හා නුසුදුසු බඩු බාහිරාදිය 1960 අගෝස්තු මස 26 වැනි සිකුරාද පෙරවරු 10.30 ට නාරාහේන්පිට පිහිටි ජාතික කිරි මණ්ඩලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

1. බයිසිකල් සහ ට්‍රයිසිකල්,
2. ටයර්,
3. දළු,
4. ටින්, කෑන් සහ බෝතල්.

මේ බඩු බාහිරාදිය, 1960 අගෝස්තු මස 25 වැනිදා පෙරවරු 10 ටත් දහවල් 12ටත් අතර කාලය තුළදී ප්‍රධාන ගබඩාකරු හමුවීමෙන් පරීක්ෂා කළ හැකිය.

මෙම බඩු ලබාගන්නන් විසින් බඩුවල සම්පූර්ණ මුදල එවේලේම ගෙවා ඒවා වෙන්දේසි දිනයෙහි පස්වරු 4ට පෙර ගෙන යා යුතුයි.

සභාපති,
ජාතික කිරි මණ්ඩලය.

---

### වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් ද්‍රව්‍ය 1960 සැප්තැම්බර් 5 වෙනි දින පූ. භා. 10ට සෙනේට් ගොඩනැගිල්ලේ පිහිටි ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කන්තෝරුවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

වෙන්දේසිය අවසාන වූ වහාම ඒවා මුදල් ගෙවා ගෙන ගිය යුතුයි.

පරන ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් 300 ක් සහ පරන ගැසට් පත්‍ර.

එෆ්. ජේ. ජී. කැස්පර්ස්,
ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
සෙනේට් ගොඩනැගිල්ල, කොළඹ 1.

---

### සේවයට අයෝග්‍ය ද්‍රව්‍ය වෙන්දේසියේ විකිණීමයි

1960 අගෝස්තු මස 24 වන බදාදා පස්වරු 2ට කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ ලංකා ගුවන් විදුලි කාර්යාලීය බඩු ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වනු ලැබේ.

මෙදින වෙන්දේසියේ විකුණනු ලබන සේවයට අයෝග්‍ය ද්‍රව්‍යයන් ගෙන් සමහරක් පහත සඳහන් වේ :—

(1) ඉලෙක්ට්‍රික් බ්ලෝවර්ස්.
(2) වැල්වස්.
(3) මෝටර් ටයර්ස්.

2. ගැනුම්කරුවන් වෙන්දේසිය අවසන් වූ වහාම මුදල් ගෙවා බඩු ඉවත් කර ගත යුතුය.

3. වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 10 සිට බඩු පරීක්ෂාකර බැලීමට පුළුවන.

වී. ඊ. ගුණරත්න,
ගුවන් වි. අ/ජ. වෙනුවට.

---

### කැලෑ දෙපාර්තමේන්තුව

ඝන අඩි 250ක් ඇති ඉරාපු ලී ගොඩවල් 10ක්ද, වට කණු 200ක් ඇති ගොඩවල් 10ක්ද, තෙක්ක වට කණු 250ක් ඇති ගොඩවල් 10ක්ද, 1960 අගෝස්තු මස 25 වෙනි ගුරුදින පෙරවරු 9ට බුත්සේ පිහිටි කැලෑ දෙපාර්තමේන්තුවේ මධ්‍ය ලී ගබඩාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා බුත්සේ විශේෂ වන පාලක තැනගෙන් විමසන්න.

ජේ. ඈල්. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

කැලෑ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 509,
කොළඹ 2.

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

### ඇල රේන්ද විකිණීම, කොළඹ දිස්ත්‍රික්කය 1960-61

කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින කාල සීමාව තුළදී පහත පෙනෙන ඇල රේන්ද පවත්වාගෙන යාම පිණිස ටෙන්ඩර් 1960 අගෝස්තු 29 වැනි දින පෙරවරු 11 දක්වා කොළඹ කච්චේරියේදී භාරගනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ :—

(1) ග්‍රෑන්ඩ්පාස් ඇල රේන්දය.
(2) හැඳල ඇල රේන්දය.
(3) මීගමු ඇල රේන්දය.

2. සෑම ටෙන්ඩරයක්ම සිල් තබන ලද කවරයක බහා, කවරය පිටත වම් පැත්තේ ඉහළ කෙළවරේ "1960-61 වර්ෂයේ .................. ඇල රේන්ද පිළිබඳ ටෙන්ඩරය" යනුවෙන් පැහැදිලිව සටහන් කර අගෝස්තු මස 29 වැනි දින පෙරවරු 11ට ප්‍රථම කොළඹ කච්චේරියේ දිසාපතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි. මෙදින නියමිත වේලාවෙන් පසු කිසියම් ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. කච්චේරියේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් විය යුතුයි.

3. කිසියම් ටෙන්ඩරයක් පිළිගත් බව දනුම් දුන් විගස ඒ අයිතිකරු විකිණීමේ කොන්දේසි පත්‍රය අත්සන් තබා ඇප වශයෙන් ටෙන්ඩරයේ වටිනාකමෙන් තුනෙන් එක් කොටසක් මුදලින් කච්චේරියේ තැන්පත් කළ යුතුය.

4. රුපියල් පනහ (රුපියල් 50) ක් මෙම කච්චේරියේ තැන්පත් කිරීමෙන් ලත් කුවිතාන්සියක් සමගම සෑම ටෙන්ඩරයක්ම එවිය යුතුය. පිළිගත් ටෙන්ඩර්කරුවාට කොන්දේසි පත්‍රය අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල් තැන්පත් කිරීමට හෝ ඒ අවස්ථාවේදී නොහැකි වුවහොත්, ටෙන්ඩරය සඳහා තැන්පත් කළ ඇප මුදල රාජ්‍ය සන්තක කරනවා පමණක් නොව, මතුවට ඔහුට රජයේ කිසිම කොන්ත්‍රාත්තුවක් ලබාගැනීමට ඉඩ නොසැලසෙනවා ඇත. පිළිගත් ටෙන්ඩර්කරු විකිණීමේ කොන්දේසි පත්‍රය අත්සන්කර නියමිත ඇප මුදල් තැන්පත් කළ පසු අනිකුත් ටෙන්ඩර් ඇප මුදල් ආපසු දෙනු ලැබේ.

5. ටෙන්ඩර් පිළිබඳ සියලුම අයිතිවාසිකම් හා අවසාන තීරණ දිසාපතිතුමා සතුය.

6. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් විමසන්න.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා.

1960 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ කච්චේරියේදිය.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.